කවිය දිව්‍යමය ප්‍රචණ්ඩත්වයේ තවත් මානයක

දකුණු කුරු දිවයිනේ අතරමං වූ කවිය

දකුණු කුරු දිව් කවි

ඕස්ට්‍රේලියාව පිළිබඳ සිංහල කාව්‍ය සංග්‍රහය

සංස්කරණය
රසික සූරියආරච්චි
හෙන්රි කුමාරප්පෙරුම

ඇබොරිජින්ස්ලා කවි තුළ හැඟවුම්කරණය කරන යථාර්ථය

දකුණු කුරු දිව් වසන ලාංකික කවියෝ එහි මුල් පදිංචිකරුවන් කෙරෙහි ඉමහත් කරුණාවකින් සහ හෘදයාංගම දැක්මකින් ඔවුනගේ ඉරණම කවි කරන්න නොමසුරු වෙති. මේ සැබැවින්ම කුමන අවිද්‍යාත්මක ප්‍රකාශනයක් ද?

වසර හැට දහස් ගණනක් මෙරට තුළ ඇබොරිජිනි තමන් හඳුනන මිනිස් කැල දඩයම් කර කමින් බුදිමින් වනෙහි පල විසුවෝ පොලෝ තලයට නොම කර අපල

ඡන්ද 2

රන් රුවන් පබලු මිණි
මිදි ඇපල් පල දැරිණි
ඇබොරිජිනි හඬ මැකිනි
සුදු දනන්ගෙන පිරුනි

ඡන්ද 5

ආදිම වැසියනගේ වත ගොත ඇසුනු සැනේ
පිඳුනු සිතැඟි විය දුක්බරව ඇස කොනේ
සාරය අනුන් සතුයෙන් එ දන දින දිනේ
පෑරෙන හඳිනි දිව් මග ගෙවෙත නැත තැනේ

ඡන්ද 6

දුටු දුටුවන්ගේ හඳවත් උණුවන ලෙස ට
වේදනා බරව නෙත නැගි කඳුළු කැට
තම වර්ගයාගෙන් සිදුවූ ගැහ ගැහැට
සමාව අයැදුවා මේ අය ඉඳිරිපිට

ඡන්ද 10 - *ආදිවාසික ළමුන් පැහැර ගැනීම*

ආදිම වැසියනගෙ ජීවන මග පාදා
රළු දිව් පෙවෙත හොබවති එහි නැත බාදා
සේවා සැමට යයි නම් එකලෙස සාදා
නොසතුට කිමඳ තුට ළං වෙයි සැප පාදා

ඡන්ද 17

සත්‍ය වශයෙන්ම ඕස්ට්‍රේලියා වේ වාසයට යන ලාංකිකයන් පළමුවෙන් අත් දකින ඔවුනගේ පහළ ජීවන මට්ටම ගැන ඔවුනට ඇති එකම සැනසිල්ල ඇබොරිජින්වරුය. මෙය සවිඥානිකව ප්‍රත්‍යක්ෂණය වී දෙවනුව අවිඥානික ෆැන්ටසිය නිර්මාණ විමට පෙළඹෙන ප්‍රාථමික සාධකය යි. දෙවනුවද ලාංකිකයන් කෙසේ හෝ රැකියා අවස්ථා උදා කරගෙන පිළිපන් ජීවිතයේ තිමක් නැති පීඩාවන් සමනය කර ගන්නා ආර්ථික ක්‍රියාවලිය තුළ තමන්ට වඩා පහළින් සිටින එකුදු මිනිස් කණ්ඩායමක පැවැත්මක් තහවුරු කරන්නේ ද මේ ඇබොරිජින්වරුමය.

මේ තමන්ට වඩා දුෂ්කර ජීවන ගත කරන ගෝත්‍රික ලක්ෂණ විඳනා දක්වන නොදියුණු ජන කොටසක් වන ඇබොරිජින් ජන කොටස් දෙස බලා තමන් අත්දකින සාපේක්ෂ හොඳ ඉරණම ගැන සතුටු විමකි. එය ඔවුන් අත්විඳින්නේ අවිඥානික ෆැන්ටසියක් ලෙස වෙස් ගන්වා ය. ඇබොරිජින්-

මේ කවියන් ට මිනිස් විෂය හමුවන්නේ කඳු ගංගා විල් පොකුණු හිම පලතුරු කුරුල්ලන් සියල්ල පසු කළ අහවර වූ විටය. මිනිස් ජීවිතය ස්පර්ශ කරන කවි අල්පයක් ඇත්තේ යැයි සැලකිය හැකි තරමට මෙම කවි ධ්‍රැවීකරණය වී ඇත්තේ ජ්‍යාමිතික වශයෙන් සිදුව ඇති දෘශ්ටිමය ප්‍රසාරණයන් අවකාශයන් සහ ඒවායේ සංගත රිද්ම විසින් ජනනය කරන ලද ගොඩයාට මැපීක් යන සංකල්පයයි.

වරු ඕස්ට්‍රේලියාවේ නොවූයේ තම ඔවුනගේ නැත ගන්නට මානසිකව සංවිධානයවන්නට සිදුවන්නේ ලාංකිකයන් වැනි දුප්පත් නොදියුණු රටවලින් එහි ඇදී ගොස් සිටිනා අයටමය. මන්ද යත් තමාගේ ඉරණම සසඳා බලා ගැනීමට තමන්ට වඩා පහළින් කිසිවෙකු නොසිටින තාක් තමන්ට විඳවන්නට සිදුවන්නේ සමාජ සංස්ථාව පතුලේම මණ්ඩි ලෙස සංශුද්ධ වූ තරමට සාපේක්ෂව අහස්ගත වූ මහා අනේකත්වයේ පරිපූර්ණ අණ පමණකි. සැබැවින්ම ඇබොරිජින්වරු ගත කරන ජීවිතය ගැන ලාංකිකයන්ට ඇත්තේ අවිඥානික සතුටකි. ඇබොරිජින්-වරු ලාංකිකයන්ගේ ගෞරවය ආරක්ෂා කර දෙති. ඒ වෙනුවට ලාංකිකයෝ ඔවුන් වෙනුවෙන් කිඹුල් කඳුලු සලති. ඔවුහු දුක් නොවින්දේ තම ලාංකිකයාට ප්‍රමෝදය ජනනය වන යථාර්ථයක් මතුකර ගැනීමේ ෆැන්ටසි තිර සඩක් ඕස්ට්‍රේලියාවේදී හමු නොවන්නේය. අප වටහා ගත යුත්තේ මේ ව්‍යාජ කෘත්‍රිම ප්‍රෝඩාව නොව යථාර්ථය තුළ ඇබොරිජින්-වරුන්ටත් වඩා අපේ ලාංකිකයෝ ගෝත්‍රික බවය.

කඳු හැපීම

දකුණු කුරු දිව් වැනුම් කවි තුළ අපට නිතරම අත්දැකින්නට ලැබෙන්නේ කවියන් විසින් මනෝමය චාරිකාවලට සහභාදයන් කැඳවා ඔවුහු හිඳවම කඳුමත හප්පමින් කරනු ලබන අලංකාරෝත්තමවාදී වචන ක්‍රීඩාවයි. කන්දක් ගැන සඳහනක් නැති කවියක් සොයා ගැනීම දුෂ්කර වන තරමටම මේ වැනුම් කවි තුළ කඳු ඇත්තේය. මෙම ස්වභාවික වර්ණනා වල නාම පද ලාංකික නාමපද වලින් ද ලෙහෙසියෙන් ප්‍රතිස්ථාපන කළ හැකි බැවින් එහි ඕස්ට්‍රේලියානු සාරය යැයි දෙයක් සොයා ගත නොහැකිය. එනමුත් මේ කවි දිගින් දිගටම ලියැවෙන බැවි ස්ථිරය.

නිමිනය ඇත ඇඳී යන්න
මහ බෙදුමකි සිකර ගොන්න
දිය දෝතක් නුඳුටු තැන්න
අහස පොලොව සිඹින වැන්න

ඡන්ද 11

මනහර උයන් ගැවසුන වතු මලින් සැඳී
පැහැසර නිහඬ බව දිවියෙහි පහස වඳී
සුමිහිර ගෙනෙන මඳු මිවිත පෙරයි මිඳී
පලතුර ගමන යයි මුලු ලොව රසය දිඳී

කුල්මත් කරන මිදි රස ලොව දෙතොල් සිපි
කල් යල් බලා වට වැසි ගං ඉවුරු සිපි
නිල් කඳුකරය පිස එන මඳ නලෙහි හැපි
මල් ගොමු සඳිත වෙයි මනහර ලෙසිනි පිපි

අතහැර මරේ හිම ඩාලිං සොයුරි දැකී
දෙතියර දොඩම් පිවස් ජලම් රසය රැකී
එනුවර මැදින් බිඳිනා ගඟ ටොරන්ස් ඉකී
දියවර මතින් මැවු සිරියකි දකිනු සකී

ඡන්ද 13

සිව් වට පවුරු බැඳි මගරම් කඳු පෙලකී
දියවට වැව් පොකුණු ගලනා සිසිලස කී
කඳිමට නොඩ නැඟුනු මංමාවත් රැසකී
මිහිබට සුරපුරකි මෙය තවිතිසාවකි

ඡන්ද 14

ඊ ඒ ඩෝසන් ප්‍රීති

ලාංකික ඕස්ට්‍රේලියානුවාට මිනිස් ආත්මය ට වඩා භෞතික ලෝකයේ ජ්‍යාමිතිය නිතර කාව්‍ය ප්‍රස්තුත බවට පත්වීම දූපත් මානසිකත්වයේ සීමා විසින් ඇති කළ සංවෘත බැවි අතිවිශාල අවකාශීය විවෘත භාවයක් තුළ දී හමුවන පුපුරා යාමේ අස්ථායී මොහොතයි. මොවුන් සියල්ලටම මේ මොහොත පසු කර යාම ක්ෂතිමය අත්දැකීම් රාශියකට තම ආත්මය එළිදරව් වීමේ වේදනාත්මක සන්තුෂ්ටිය හෙවත් ප්‍රමෝදය නිර්මාණය කරයි.

මේ කවියන් ට මිනිස් විෂය හමුවන්නේ කඳු ගංගා විල් පොකුණු හිම පලතුරු කුරුල්ලන් සියල්ල පසු කළ අහවර වූ විටය. මිනිස් ජීවිතය ස්පර්ශ කරන කවි අල්පයක් ඇත්තේ යැයි සැලකිය හැකි තරමට මෙම කවි ධ්‍රැවීකරණය වී ඇත්තේ ජ්‍යාමිතික වශයෙන් සිදුව ඇති දෘශ්ටිමය ප්‍රසාරණයන් අවකාශයන් සහ ඒවායේ සංගත රිද්ම විසින් ජනනය කරන ලද ගොඩයාට මැපීක් යන සංකල්පයයි. ඇත්ත වශයෙන්ම විශාල හැම දෙයක්ම ඉඳිරියේ නොදරුවන් මෙන් ඒවායේ දිග පළල උස වවනවලට පෙරළගන්න තටමන කවි වලින් මේ බහුතරයක් කවි අවර්ණ වී ඇත්තේය. ඔවුහු අවංකව වචන හිඟ වීමෙන් මේ වර්ණනා සීමා කරගනිති.

මේ විශාල මංමාවත් ගොඩනැගිලි කඳු ශිඛර මේ ආකාරයෙන් විශ්මය නිර්මාණය කරමින් වචන සොයා වෙහෙසෙන්නේ මන්දැයි විමසූ විට හමු වැනුම් ඔස්සේ ඕස්ට්‍රේලියාවේ අපූර්වත්වය වචන හරහා වර්ණනා විෂය අතික්‍රමණය කරමින් පින්තාරු කරන ලාංකික කවියෝම නැවත වරක් ඔවුනගේ දුර්දසාසම්පන්න විගාමික ජීවිතය ගැන අඩෝවැඩියාවන් සංක්‍රමණික සිතුවිලි අස්සේ වගුරුවති.

වන්නේ මේ කවියන් තුළ පවතින දූපතක ලද වූල අත්දැකීම් විසින් හිඳෙවූ අවිඥානයේ හිස් තැන් වසා සුවනය කර ගැනීමට විශය ලෝකයෙන් මනසට ප්‍රක්ෂේප කරගත් මහ අනේකත්වය පිළිබඳ පාරාදීසයේ වැළපෙන අධ්‍යාත්මික මළ කඳන්

අදහස් ජාලයයි. ඕස්ට්‍රේලියානු පොළවේ රන් රේඛා මෙන් ඇඳී ඇති මහා මාර්ග හෝ අහසේ ගෑවෙන විදුරු ක්ලැඩින් වලින් වැසී ගිය දැවැන්ත කුළුණුමය ගොඩනැගිලි හෝ අද්‍යතන නගරාංලකාරයේ කැඩපත් බඳු පිරිසිදු පිළිවෙල ලත් වනෝද්‍යාන ආදියට පිටුපා ජාසාරූප ගත නොවන්නේ තම ඔවුන් පවතින්නේ නැත. පසුබිම විසින් ඔවුන් පවත්වා ගනී. ඔවුන්ගේ ජීවිතයේ සංස්කෘතික පදනම භෞතික පසුබිම පමණි. මේ හේතුවෙන් කවි තුළ හමුවන්නේ ඕස්ට්‍රේලියාවේ පසුබිම පමණි. කවියන් එහි ගිලී දියව් නැති වී ඇත. එහෙයින් ඔවුනට හඳිසියේම ලාංකික සංස්කෘතිය ප්‍රතිනිර්මාණය කර ගැනීමේ යුටෝපිය අවශ්‍යතාවයෙන් පීඩාවට පත් වන්නට සිදු වේ. මේ පීඩාවම ඔවුනගේ ආශාවන් සංවිධානය කරන බලවේගයයි.

භෞතික පාරාදීසයේ වැළපෙන අධ්‍යාත්මික මළ කඳන්

දකුණු කුරු දිව් කවි පොතේ ප්‍රහසනාත්මක විරුද්ධාභාසයක් හමු වේ. වැනුම් ඔස්සේ ඕස්ට්‍රේලියාවේ අපූර්වත්වය වචන හරහා වර්ණනා විෂය අතික්‍රමණය කරමින් පින්තාරු කරන ලාංකික කවියෝම නැවත වරක් ඔවුනගේ දුර්දසාසම්පන්න විගාමික ජීවිතය ගැන අඩෝවැඩියාවන් සංක්‍රමණික සිතුවිලි අස්සේ වගුරුවති. පාරාදීසයකට අවතීර්ණව හිඳිය ද ඔවුන් විඳින්නේ අකම්පාලයන් ය. මේ කුමන කරුමයක් දැයි කිසිවෙකුත් සංදෝ නොකරති. මෙතැන හට ගන්නා කරුමය ලෙස යථ සහ යථාර්ථය අතර පැල්ම තුළ ඔවුනු තම ෆැන්ටසි ලෝකයේ බණ්ඩාංක නිවැරදිව ලකුණු කර ගනිති. ඕස්ට්‍රේලියාවේ සරණ සොයා එහි ගොස් තැන්පත් වූවන්ට ඇත්තේ ෆැන්ටසි ලෝකයක් බැවි මේ පැල්ම වසා දමන්නට ඔවුහු යොදන සියළු උත්සාහයන් තුළින් යලි යලින් ඉස්මත්තට මතුව එයි. ෆැන්ටසි ලෝකයක පීවත් වීම කරුමයකි. ලාංකිකයා අත්දැකින එම කරුම ප්‍රමෝදය නිවැරදි සෙයම සමපාත වන්නේ 1999 මැට්රික්ස් සිනමා පටයේ සිගින ලෝකවල දිය වෙමින් තම ශක්තිය මහා අනෙකා වෙත අවිඥානිකව උරා ගන්නට සලස්වපු ඒ සිස්ටම් එකටය. ඒ ගෙවන කරුමයේ යථාර්ථවත් වචන ප්‍රබන්ධ සංක්‍රමණික සිතුවිලි ඔස්සේ සිංහල පාඨකයා වෙත ගෙන ඒම නුදු ප්‍රමෝදයේම වෙස් මුහුණක් පමණි.

බුදුන් වැඳ කවි ලියන මේ යථාර්ථය කුමක් ද?

දැන් මම අංශක එකසිය අසූවක් කරකැවී වෙනත් දිසාවකට ගමන් අරඹමි. උතුරු කුරු දිව් කවි පොත වචනාර්ථ ඔස්සේ කෘත්‍රිම සහ හඳිසි සිංහල බෞද්ධත්වයකින් ඔප වැඩි අති ඉසව්වයි ඒ මගේ ගමනාන්තය. මේ හඳිසිය කොතරම් ද යත් එය සියවස් ගණනක් පසුපසට කාල උමගකින් ගොස් හනි හනික උපයා ගත් පොරාණික ආඛ්‍යානයකින් බෞද්ධ ස්පර්ශයකින් සංස්කෘත කාව්‍ය ආකෘතියකින් කවි පබඳන්නට ඔවුන් පෙළඹේ. මෙහි හාස්‍යජනක අන්තය නම් ඕස්ට්‍රේලියාවේ දැවැන්ත ධනේශ්වර ආර්ථික සහ තාක්ෂණික ලෝකයේ පරිභෝජනවාදී සංස්කෘතික විශ්වයේ දැවැන්ත මකුළු දැලේ පැටලී ජීවත්වන අතරවාරයේ මේ හඳිසි ව්‍යාපෘතියට තමන්ව කැඳවා ගන්නට දරන පටිසෙ-ාතගාමී ඇණවුමයි. මෙය අප වටහා ගත යුත්තේ කෙළෙසද? සරලව නැවත එම කුතූහලය සැසඳුවොත් ඇයි ඕස්ට්‍රේලියානු ලාංකිකයන්ට සිංහල මහා සම්ප්‍රදායික ලක්ෂණ කාවද්දා හනිකට කවි පොතක් කරන්නට හිතෙන්නේ?

මෙය දේශපාලනික අර්ථයක් ගන්නේ විකට ඇඳුම් තරගයක ස්වරූපයකිනි.

"අනේ ලංකාවේ දුක් විඳින සිංහල කවි ලියන නොලියන සහෝදරවරුනි. අපි අපේ අතිරික්ත ප්‍රමෝදය ඕස්ට්‍රේලියාවේ දී අත්කරගෙන ඇත්තෙමු. ඉතිං අපේ ප්‍රමෝදය නසන්නට විනෝදය කඩන්නට මෙහි එන්නට එපා. අපි එවන්ගම් අපේ ප්‍රමෝදය මුදුණය කරලා. මොකද අපි ලංකාවට නොඑන්නේද අපටම මෙහිදී නිර්මාණය කරගත හැකි ලාංකික සංස්කෘතියක් අප විසින්ම නිපදවා ගන්නා හෙයිනි. එහෙයින් මේ කවි කියවා බලන්න. පාරාදීසයේ මළ කඳන් සේ අප පැවතුන ද අපට එය විනෝදයකි. එය බිඳින්නට ඔබ මෙහි නොඑනු මැනවි. මහා සම්ප්‍රදාය මෙන්ම වූල සම්ප්‍රදායයද අප විසින් මෙහි නිර්මාණය කරමින් සිටිනා බැවින් අපට අප මෙහිදී හමු වේ. නව දුරටත් ලංකාවේ භෞතික ජීවිතයේ අනොරක් නැති හිංසනයට වඩා මේ විඳින මහා පරිමාණ ධනේශ්වර ජ්‍යාමිතික වස්තු තුළ අපේක්ෂා අපි නිපදවමින් ගත කරන කාලය විසින් අපව නුරුබුනුට් ස්මාට් සමාජ කොටසක් බවට පත්වෙමින් ඇත. ඇත්තටම අපි ලංකාවේදී ගත කරනවට වඩා සංස්කෘතිකය මෙහේ ඉන්දැරදිදී. මේ අපේ සංස්කෘතික ජීවිතයේ තත්වය පිළිබඳ ප්‍රකාශනයකි. කරුණාකර මේ කවි විශ්වාස කරන්න."

මේ ඒ හඳිසි ඇණවුමේ මානවීය වචනවල පෙළයි. ඕස්ට්‍රේලියානු ලාංකිකයන්ගේ අවිඥානික ප්‍රකාශනය යි.

එක් අතකින් දකුණු කුරු දිවයින මිහි පිට දේව උයනෙකි අනසින් වැටුණු කියන ඕස්ට්‍රේලියානු ලාංකික කවියා අනෙක් අතට අප කවුරුදැයි අපටම පහදා දේවා යනුවෙන් ලියන්නේ මේ තත්වය නිසාවෙනි.

"සන්නස" කවි ලියූ අයද මෙහි වෙති. එනමුත් " සන්නස" කතා කවියෙක් නොවෙයි.

දැන් නැවතත් අංශක අනුවකින් හැරී වෙනත් ඉසව්වකට යමි. මේ ඉසව්ව ටිකක් ප්‍රගුප්සාජනක සිතුවිලි මවන භයංකර මානුෂික සම්බන්ධතා පිළිබඳ නාස් කඩා යන දුර්ගන්ධයකින් යුතු පෙදෙසකි. දකුණු කුරු දිව් කවි පොතේ කවි සපයා ඇති සමහර අය ඕස්ට්‍රේලියාවේ සිංහල කියවන අය අතර ප්‍රචලිත සන්නස සාහිත්‍ය සරාවේ ද කවි ලියා පළ කළ අයම වෙති. ඒ බැව් කිව්වර තනු යටතේ පෙළ ගස්වා ඇති සටහන් අතර සඳහන් වේ. සන්නස සාහිත්‍ය සඟරාවේ ප්‍රමුඛ වැඩ කොටසක් කරන්නේ ජගත් ජේ එදිරිසිංහ කවියා ය. ඔහු සක්‍රිය නිර්මාණශීලි ඕස්ට්‍රේලියානු දහරාවේ දැනුවත්ව මග හැර යා නොහැකි පුද්ගලයෙකි. නමුත් දකුණු කුරු දිව් කවි පොතේ එක වර්ග අඟලක් ඔහුගේ කවියකින් වැසී නැත. මෙය පළමු වටයේදීම මා විශ්මයට පත් කළ නිර්කෂණයකි.

අනෙක් අතට සංක්‍රමණික දුක්බ පීඩා කවි කිරීමේ කුසලතාවයෙන් අගතැන්පත් ප්‍රවීණ කිව්වර සුනිල් ගෝවින්න ගේ එකඳු කවියක් වත් මෙම ඓතිහාසික අවස්ථාවට දායක කරගෙන නොමැති බැව් දක්නට ලැබුණි. මා දන්නා පරිදි රසික සූරියආරච්චි සහ මොවුන් දෙපල අඹ යහළුවන් මෙන් එකල බූන්දියේ ඕස්ට්‍රේලියානු කවියන් නියෝජනය කරමින් වැජඹෙනු මා දැක ඇත. මා පෞද්ගලිකව විශ්වාස කරන්නේ ද රසික සහ ඔවුන් අතර සාහිත්‍යමය නිර්මාණාත්මක ගනුදෙනුවක් සවිඥානිකව තිබූ බැවිය.

අනෙක් අතට පසුගිය වසරේ ගොඩගේ සාහිත්‍ය